# ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය /ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය

ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2004.06.04 දිනැතිව අනුමත කරන ලද සහ ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2005.03.04 දින අනුමත කරන ලද ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රියදුරන් සඳහා රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට පහත සඳහන් බඳවා ගැනීමේ පරිපාටිය පළ කරනු ලැබේ.

01. තනතුරු නාමය - ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය රියදුරු

02. තනතුර අයත් දෙපාර්තමේන්තුව :- ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව / ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

අමාත්‍යාංශය ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය

03. ක්‍රියාත්මක වන දිනය - 2006.01.01

04. අර්ථ නිරූපණ

04.1 බඳවා ගැනීමේ පරිපාටිය යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය/ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය රියදුරු තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය වේ.

04.2 කොමිෂන් සභාව යනුවෙන් අදහස් වන්නේ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

04.3 ප්‍රධාන ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා වේ.

04.4 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

04.5 අමාත්‍යාංශ ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් සභාවේ සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

04.6 දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස් වේ

04.7 සේවාව යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය රියදුරු සේවය වේ.

04.8 " නියමිත දිනය" යනුවෙන් අදහස් කරනුයේ මෙම සේවයට/ බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනය වේ.

04.9 මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අදාළ කාර්යයන් සඳහා "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ උසස්වීම් සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න වසර 05 ක සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූද ඒ කාලය තුළ කළ වරදකට අවවාද කිරීමක් හෝ තදින් අවවාද කිරීමක් හැර දඬුවමක් නැත්තා වූද සේවා කාලයකි.

**05. තනතුරේ සාරාංශය**

දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පැවරූ නිළධාරියාගේ උපදෙස් මත පවරා දී ඇති වාහන දෙපාර්තමේන්තු නිති වලට හා මහා මාර්ග නිති වලට අනුකූලව වාහන පැදවීම, වාහනයේ ආරක්ෂාව හා නඩත්තුව, ධාවන තොරතුරු ලේඛණගත කිරීම.

**06. සේවා කොන්දේසි :-**

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු,අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

06. 1. තෝරා ගනු ලබන්නන් ආයතන සංග්‍රහයේ ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග / රෙගුලාසි හා රජය මගින් හෝ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කළ නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසි වලට ද යටත් විය යුතුය

06.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 ප්‍රකාරව පත්වීමේ දින සිට වසර පහක් (05) තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

06.3 ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා ඡේද වල විධි විධාන ද අදාළ වේ.

**07. වැටුප් ක්‍රමය හා සේවක ව්‍යුහය :-**

7. 1 සේවක ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය PL -3 - 2006
රු. 12360 - 10 x 110 - 10 x 120 - 10x 130 - 12 x 140 - 17640

7.2 සේවක ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක මාසික වැටුප් පියවර

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් පරිමාණය | ආරම්භක වැටුප | වැටුප් කේත අංකය |
|---|---|---|---|---|
| III | පියවර 01 | රු. 12360 - 10 x 110 - 10 x 120 - 10x 130 - 12 x 140 - 17640 | රු. 12360/- | PL - 3 - 2006 |
| II | පියවර 12 | රු. 12360 - 10 x 110 - 10 x 120 - 10x 130 - 12 x 140 - 17640 | රු. 13580/- | |
| I | පියවර 22 | රු. 12360 - 10 x 110 - 10 x 120 - 10x 130 - 12 x 140 - 17640 | රු. 14790 | |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | රු. 12360 - 10 x 110 - 10 x 120 - 10x 130 - 12 x 140 - 17640 | රු. 16100/- | |

7.3 සේවක ව්‍යුහය

එක් එක් ශ්‍රේණිය සඳහා වෙන් වූ සේවක සංඛ්‍යාවක් නොමැත. III , II , I සහ විශේෂ ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවට අයත් වේ.

## 08. බඳවා ගැනීමේ සුදුසුකම්

8. 1. 1 අධ්‍යාපන සුදුසුකම් :-

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය, භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06 කින් සමත් වී තිබිය යුතුය.

8. 1.2 ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා

අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතාව පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත් පත් කරගෙන තිබිය යුතුය.

* බඳවා ගන්නා දිනට වසර 05 කට පෙර නිපුණත්ව සහතිකය ලබා තිබිය යුතුය. වාහන පන්තිය (A)

8. 1.3 පළපුරුද්ද :-

අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම - යටත් පිරිසෙයින් අවුරුදු 03 ක වත් පළපුරුද්දක් තිබිය යුතුය. මෙම පළපුරුද්ද ලිඛිත ලියවිලි මගින් සනාථ කළ යුතුය. එය රජයේ හෝ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ගත් සහතිකයක් විය යුතුය.

8.2 වයස

බඳවා ගැනීමට අදාළව අයදුම්පත් කැඳවන දිනට හෝ නියම කරනු ලබන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවෙකුට එනම් ඒ වන විටත් රාජ්‍ය සේවයේ හෝ ඌව පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයෙක් නම් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

8.3 පොදු යෝග්‍යතා :-

8.3. 1 යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

8.3.2 ඌව පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03 ක වත් ස්ථිර පදිංචිය ඇති පිරිමි අයදුම්කරුවන් විය යුතුය. ඡන්ද හිමි නාම ලේඛණය මගින් පදිංචිය සනාථ කළ යුතුය.

8.3.3 අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 2 ක් විය යුතුය.

8.3.4 දිවා කාලයේ සහ රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

## 09. බඳවා ගැනීමේ ක්‍රමය :-

රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් පසුව අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සපුරා ඇති අයවලුන් පමණක් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිට අනතුරුව රියදුරු තනතුරට අදාළ වන පරිදි ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත වැඩිම ලකුණු ලබා ගැනීමේ පදනම මත බඳවා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

**ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය**

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 1. මාර්ග නීති පිළිබඳ දැනුම<br>මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ සාමාන්‍ය දැනුම | පැය 0 1 | 100 |
| 2. ප්‍රායෝගික පරීක්ෂණය | පැය 0 1 | 100 |
| මුළු එකතුව | | 200 |

ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

## 10. කාර්යක්ෂමතා කඩඉම්

ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් මෝටර් රථ පරීක්ෂකගේ සහාය ඇතිව මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වනු ලැබේ. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ලිඛිත පරීක්ෂණයක් වශයෙන් පැවැත්වේ.

10. 1 පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අදාළ සේවයේ III වන ශ්‍රේණියට පත්වී වසර තුනක් (03) ක් ඇතුළත සමත් විය යුතුය.

දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අදාළ සේවයේ II ශ්‍රේණියට පත්වී වසර 03 ක් ඇතුළත සමත් විය යුතුය.

තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අදාළ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ඇතුළත සමත් විය යුතුය.

<u>පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය</u>

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 01. මෝටර් යාන්ත්‍රික විද්‍යාව සහ මහා මාර්ග නීති - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි | 1 | 80 |
| 02. වැඩ පැමිණීම හා හැසිරීම | - | 20 |
| මුළු ලකුණු | | 100 |

වැඩ පැමිණිම, හැසිරීම සඳහා ලකුණු අදාළ ආයතන ප්‍රධානින් වෙතින් රහස්‍ය වාර්තා මගින් ලබා ගනු ලැබේ. කාර්යක්ෂමතා කඩ ඉම සමත් වීම සඳහා ලකුණු 40 % ක් ලබා තිබිය යුතුය.

10.2 **දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය**

ලිඛිත පරීක්ෂණයකි. විෂය නිර්දේශය පහත පරිදි වේ.

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 01. වාහනවල සුළු කාර්මික දෝෂ හඳුනා ගැනීම - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි | 1 | 80 |
| 02. වැඩ පැමිණිම හා හැසිරීම | - | 20 |
| මුළු ලකුණු | | 100 |

වැඩ පැමිණිම, හැසිරීම සඳහා ලකුණු අදාළ ආයතන ප්‍රධානින් වෙතින් රහස්‍ය වාර්තා මගින් ලබා ගනු ලැබේ. කාර්යක්ෂමතා කඩ ඉම සමත් වීම සඳහා ලකුණු 40 % ක් ලබා තිබිය යුතුය.

10.3 **තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය**

විෂය නිර්දේශය පහත පරිදි වේ

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 01. වාහන නඩත්තු කටයුතු පිළිබඳ දැනුම බහුවරණ ප්‍රශ්න පත්‍රයකි | 1 1/2 | 80 |
| 02. වැඩ පැමිණිම හා හැසිරීම | - | 20 |
| මුළු ලකුණු | | 100 |

වැඩ පැමිණිම, හැසිරීම සඳහා ලකුණු අදාළ ආයතන ප්‍රධානින් වෙතින් රහස්‍ය වාර්තා මගින් ලබා ගනු ලැබේ. කාර්යක්ෂමතා කඩ ඉම සමත් වීම සඳහා ලකුණු 40 % ක් ලබා තිබිය යුතුය.

10.4 ඉහත සඳහන් පරිදි නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවන තැනැත්තන් පිළිබඳව ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව ක්‍රියා කරනු ලැබේ.

10.5 අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක්වත් ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලැබේ.

## 11. උසස් වීම් :-

කාර්ය සාධනය පදනම් කර ගත් පහත දැක්වෙන ආකාරයේ උසස් වීම් ක්‍රමයක් හිමි වේ.

### 11.1 සේවක ගණයෙහි III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

#### 11.1.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නන් ,

(අ) පූර්ව අවශ්‍යතා

I. පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කර තිබීම.

II. සේවක ගණයේ III ශ්‍රේණියේ වසර දහයක ( 10) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

III. රාජ්‍ය පරිපාලන 8/98 චක්‍රලේඛ අනුව කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව සතුටුදායක මට්ටමේ කාර්ය සාධනයක් පූර්වාසන්න වසර දහය( 10) තුළ පෙන්නුම් කර තිබීම.

IV. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

V. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

VI. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍ර අංක 01 මගින් ආයතන ප්‍රධානියා මගින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව II ශ්‍රේණියට උසස් කිරීම ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

#### 11.1.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කර තිබීම.

II. සේවක ගණයේ III ශ්‍රේණියේ වසර හය (06) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය පරිපාලන 8/98 චක්‍රලේඛ අනුව කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්න වසර පහ (05) තුළ හොඳයි හෝ ඉහළ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර හය (06) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනයේදී සමත් වී තිබීම.

VI. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

VII. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්වීම් විභාගය සමත්ව තිබීම.

**11.1.3. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් වීම් සඳහා විභාග විෂය නිර්දේශය :-**

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 1. ආයතන සංග්‍රහය හා පළාත් සභා මුදල් රීති සංග්‍රහය පිළිබඳ සාමාන්‍ය දැනුම<br>ආයතන සංග්‍රහය පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>II ,VII , XII, XXIV, XXVII, XLVII<br>පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ<br>මු.නි.51, 52, 54, 55 | පැය 01 | 100 |
| 2. රියදුරෙකු විසින් ගිලන් රථයක සේවයේ යෙදීමේදී පිළිපැදිය යුතු කරුණු | පැය 01 | 100 |
| මුළු එකතුව | | 200 |

විභාගය සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 % ක් ලබා ගත යුතුය

(ආ) උසස් වීමේ ක්‍රමය

මෙම ලිඛිත විභාගය සඳහා අයදුම්පත් ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් කැඳවනු ලැබේ. මෙම විභාගය සඳහා අවුරුදු 06 ක සේවා කාලය හා අනිකුත් පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ සේවකයින්ට අයදුම් කළ හැක. මෙම විභාගය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරකි. සෑම වසරකටම එක් වරක් මෙම විභාගය ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ විෂයභාර ලේකම් විසින් පවත්වනු ලැබේ. උසස්වීම සඳහා ඉල්ලුම් කිරීමට නියමිත ආකෘති අංක 01 භාවිතා කළ යුතු වේ.

සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ විභාගය සමත් හා අනිකුත් පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් නියමිත ආකෘති පත්‍රය මගින් ආයතන ප්‍රධානියා/ අමාත්‍යාංශ ලේකම් මගින් ඉල්ලීමක් කරනු කරනු ලැබූ විට සම්මුඛ පරීක්ෂණයකින් පසු පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරික්ෂා කිරීමෙන් පසු උසස්වීම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

## 11.2 සේවක ගණයෙහි II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

### 11.2.1 සාමාන්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. සේවක ගණයේ II ශ්‍රේණියේ වසර දහයක (10) සේවා කාලයක් තිබිය යුතුය.

II. උසස් වීම් ලබන දිනට පූර්වාසන්න වසර 05 ක කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයා ගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

III. I හා II කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්න වසර දහය( 10) තුළ සතුටුදායක මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කර තිබීම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍ර අංක 02 මඟින් ආයතන ප්‍රධානියා මඟින් අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

### 11.2.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. සේවක ගණයේ II ශ්‍රේණියේ වසර අටක(08) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම .

II. උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර පහක (05) කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව උසස්වීමේ පූර්වාසන්න වසර පහ(05) තුළ හොඳයි හෝ රට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. I හා II කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනයේදී සමත් වී තිබිය යුතුයි.

VI. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්වීම් විභාගය සමත්ව තිබීම.

### 11.2.3 සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් වීම සඳහා විභාග විෂය නිර්දේශය

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| I. **මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම**<br>I. මෝටර් යාන්ත්‍රික ශිල්පය පිළිබඳ සාමාන්‍ය දැනුම<br>II. වාහන නඩත්තු කටයුතු පිළිබඳ දැනුම<br>III. සුළු අළුත්වැඩියා හා අමතර කොටස් හඳුනා ගැනීම් පිළිබඳව ඇති අවබෝධය<br>IV. කාර්මික දෝෂ<br>V. ධාවන සටහන් පොත් පවත්වා ගෙන යාම | පැය 0 1 | 100 |
| II. **ආයතන සංග්‍රහය හා පළාත් මුදල් රීති සංග්‍රහය පිළිබඳ මූලික කරුණු**<br>මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ II, VII, XII, XLVII, XLVIII ජේද හා මු.නි.5 1,52 හා 54,55 මත සැකසේ | පැය 0 1 | 100 |
| III. **රියදුරෙකු විසින් ගිලන් රථයක සේවයේ යෙදීමේදී පිළිපැදිය යුතු කරුණු** | පැය 0 1 | 100 |
| **මුළු එකතුව** | | 300 |

විභාගය සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 % ක් ලබා ගත යුතුය

(ආ) **උසස් වීමේ ක්‍රමය :-**

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් වෙතින් ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉදිරිපත් වන අයදුම්කරුවන් ඉහත විභාගයට ඉදිරිපත් කර ඉන් සමත් වන්නන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු I ශ්‍රේණියට උසස් කිරීම ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ලැබේ. සෑම වර්ෂයකටම එක් වරක් මෙම විභාගය ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලැබේ. මෙම විභාගයට පෙනී සිටිය හැක්කේ එක් වරකි. උසස්වීම සඳහා ඉල්ලුම් කිරීමට නියමිත ආකෘති පත්‍ර අංක 02 භාවිතා කළ යුතුය.

## 11.3 සේවක ගණයෙහි I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

### 11.3.1 සාමාන්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. සේවක ගණයේ I ශ්‍රේණියේ වසර දහයක(10) සේවා කාලයක් තිබිය යුතුය.

II. උසස් වීම් ලබන දිනට පූර්වාසන්න වසර 05 ක කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයා ගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

III. I , II හා III කාර්යක්ෂමතා කඩඉම් සමත් වී තිබීම.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්න වසර දහය(10) තුළ සතුටුදායක හෝ රට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍ර අංක 03 ඇසුරින් ආයතන ප්‍රධානියා මඟින් අමාත්‍යාංශ ලේකම් මඟින් ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම ධාව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් උසස් වීම් සිදු කරනු ලැ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

### 11.3.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. I ශ්‍රේණියේ වසර නවයක (09) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. අයදුම් කරන දිනට පූර්වාසන්න වසර පහක (05) කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව උසස්වීමේ පූර්වාසන්න වසර නවය(09) තුළ සතුටුදායක හෝ රට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනයේදී සමත් වී තිබීම.

VI. විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත්ව තිබීම.

**විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සඳහා විභාග විෂය නිර්දේශය**

**ලිඛිත පරීක්ෂණය**

| | විෂය | කාලය | ලකුණු |
|---|---|---|---|
| I. | **මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම**<br>මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ සාමාන්‍ය දැනුම | පැය 01 | 100 |
| II. | **ආයතන සංග්‍රහය හා පළාත් මුදල් රීති සංග්‍රහය පිළිබඳ මූලික කරුණු**<br>මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ XXVIII, XXXII, XXv, XLVII, XLVIII ජේද හා මුදල් රීති සංග්‍රහයේ මු.නි.82,83 හා 84,85 ජේද මත පදනම් වේ. | පැය 01 | 100 |
| | මුළු එකතුව | | 200 |

විභාගය සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 % ක් ලබා ගත යුතුය.

(ආ) උසස් වීමේ ක්‍රමය

පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් වෙතින් ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. ලිඛිත විභාගය සමත් වුවන් සම්මුඛ පරීක්ෂණයකින් පසුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. මෙම උසස් කිරීමේ විභාගය සෑම වසරකම ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලැබේ. මෙම විභාගයට පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි. උසස්වීම සඳහා ඉල්ලුම් කිරීමට නියමිත ආකෘති පත්‍ර අංක 03 භාවිතා කළ යුතුය.

## 12. අන්තර්කාලීන විධි විධාන යටතේ අන්තර්ග්‍රහණය කිරීම් :-

12.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 මගින් ලබා දී ඇති PL - 3 - 2006 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධි විධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය.

I. PL - 3 - III ශ්‍රේණිය

(අ) PL - 3 - 2006 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II හා I හෝ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL - 3 - III ශ්‍රේණියට 2006.01.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II. PL - 3 - II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 20 ට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) PL - 3 - 2006 වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09 ක කාලයක් සම්පූර්ණ කර නැති සේවකයන්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 සම්පූර්ණ වුවද I හෝ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL - 3 - II ශ්‍රේණියට 2006.01.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

III. PL - 3 - I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20 ක් හෝ රට වැඩි එහෙත් අවු 30 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) ඉහත සඳහන් II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09 ක් හෝ රට වැඩි එහෙත් අවුරුදු 19 ක සේවා කාලයක් ඇති , එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ඇ) PL 3 - 2006 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL - 3 - I ශ්‍රේණියට 2006.0 1.0 1 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

IV. PL - 3 - 2006 විශේෂ ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 30 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) ඉහත සඳහන් II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 19 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ඈ) PL - 3 - 2006 වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන සේවකයින්.

PL - 3 - විශේෂ ශ්‍රේණියට 2006.0 1.0 1 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

මෙම සියළුම අන්තර්ග්‍රහණය කිරීම් සඳහා ආයතන ප්‍රධානියා / අමාත්‍යාංශ ලේකම් මගින් ඉල්ලීම් කළ පසු ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් අන්තර්ග්‍රහණය කිරීමේ ලිපි නිකුත් කරනු ලැබේ.

30

## 12.2. අන්තර් කාලීන විධි විධාන

මෙම එක් එක් ශ්‍රේණි සඳහා අන්තර්ග්‍රහණය වීමට 20 10.0 1.0 1 දින සිට 20 12. 12.3 1 දින දක්වා කාලය තුළ සුදුසුකම් සපුරාලන අය වේ නම් ඔවුන්ට පෞද්ගලික වන සේ අදාළ කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් වීම සඳහා වසර 03 ක සහන කාලයක් ලබා දීමට විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි කටයුතු කළ හැක.

## 13. පාලනය

13.1 ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය හා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය රියදුරු සේවය මෙම බඳවා ගැනීමේ පරිපාටියෙන් පාලනය වේ.

13.2 මෙම බඳවා ගැනීම් පරිපාටියෙහි විධි විධාන සළසා නොමැති කරුණු පිළිබඳව ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 විධි විධාන ප්‍රකාර සංශෝධන ඇතුළත් කර සැකසූ ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය/ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය රියදුරු බඳවා ගැනීම් පරිපාටිය බව සහතික කරමු. අනුමැතිය සඳහා ඉදිරිපත් කරමු.

2009.07.08
..............................
දිනය

..............................
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ(ඌව)
නිල මුද්‍රාව

2009.07.08
..............................
දිනය

..............................
පළාත් ආයුර්වේද කොමසාරිස්(ඌව)
නිල මුද්‍රාව
පී.ඩබ්ලිව්. ඩබ්ලිව්. දිසානායක
ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් (වැ.බ)
ආයුර්වේද දෙපාර්තමේන්තුව
දියතලාව

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :-**

නිර්දේශ කරමි/ ~~නොකරමි~~

අංකය :- 5/37/1/24
දිනය :- 2009.07.08
අත්සන :- [signature]
(නිල මුද්‍රාව)
[illegible] අඹන්වල
ලේකම්.
සෞඛ්‍ය, [illegible] සමාජ සුභ සාධන,
[illegible] අමාත්‍යාංශය.
ඌව පළාත.

**ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :-**

නිර්දේශ කරමි/ නොකරමි

අංකය :-

දිනය :- 31/07/2009

අත්සන :-

පී.බී. අමරසේකර
ප්‍රධාන ලේකම්
(ඌව පළාත)

**ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :-**

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අනුමත කරමි

1. සභාපති :-
2. සාමාජික :-
3. සාමාජික :-
4. සාමාජික :-
5. සාමාජික :-

දිනය :-

**ආණ්ඩුකාරවර ලේකම්**

2009-9-01. දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 09 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය රියදුරු තනතුරු සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

ලේකම්,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් කාර්යාලයේදිය

අනුමත කරමි/නොකරමි

සි.නන්ද මැතිව්
ඌව පළාත් ආණ්ඩුකාරවර

දිනය :- 2009.09.16

සි. නන්ද මැතිව්
ඌව පළාත් ආණ්ඩුකාරවර

ආකෘති (1)

## රියදුරු ශ්‍රේණියේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට
## උසස් කිරීමේ (සාමාන්‍ය ක්‍රමය / සුවිශේෂී ක්‍රමය) අයදුම්පත

(අදාළ නොමැති වචන කපා හරින්න . 1 09 දක්වා ඡේද අයදුම්කරුද ඉතිරි 10 12 දක්වා ඡේද පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන ඒකක ප්‍රධානියා පිරවිය යුතුය)

01. සම්පූර්ණ නම - ..............................................................

02. දැනට දරණ තනතුර ශ්‍රේණිය - ..............................................................

03. උසස්වීම් අයදුම්කරන අංශය (සාමාන්‍ය මට්ටම සුවිශේෂී මට්ටම) ..............................

04. සේවා ස්ථානය - ..............................................................

05. මුල් පත්වීම් දිනය ..............................................................

06. සේවයේ ස්ථිර කර තිබේද ? - ..............................................................
   * ලිපියේ අංකය හා දිනය - ..............................................................

07. I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ වර්ෂය හා දිනය ..............................
   ලිපියේ අංකය ..............................

08. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ වර්ෂය හා දිනය ..............................
   ලිපියේ අංකය ..............................

09. දෙවැනි භාෂා පරීක්ෂණය සමත් වූ වර්ෂය ..............................
   ලිපියේ අංකය ..............................

10. II ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත් වූ වර්ෂය හා දිනය ..............................
   ලිපියේ අංකය ..............................

රියදුරු සේවයේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට සාමාන්‍ය ක්‍රමය සුවිශේෂී ක්‍රමය යටතේ උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබා ඇති බව සහතික වෙමි.

.............................. ..............................

(දිනය) (අයදුම්කරුගේ අත්සන)

11. උසස් වීමට පූර්ව වසර 05 තුළ වැටුප් වර්ධක උපයා ගෙන තිබේද ?

| වර්ෂය | ලබා ගත් වැටුප |
|---|---|
| ...................................... | .................................................. |
| ...................................... | .................................................. |
| ...................................... | .................................................. |
| ...................................... | .................................................. |
| ...................................... | .................................................. |

12. පූර්වාසන්න වසර 06 තුළ කාර්ය සාධන ඇගයීම් වාර්තාවේ සමස්ථ ඇගයීම් විස්තර

| | |
|---|---|
| ...................................... | .................................................. |
| ...................................... | .................................................. |
| ...................................... | .................................................. |
| ...................................... | .................................................. |
| ...................................... | .................................................. |

13. 1. සේවක මහතාට එරෙහිව විනය පරීක්ෂණ තිබේද ? ..........................................................
එම විස්තර

2. සිදුවී ඇති වාහන අනතුරු තිබේද තිබේද ? ..........................................................
එම විස්තර

පෞද්ගලික ලිපි ගොනුව අනුව ඉහත අංක 1 - 13 කරුණු නිවැරදි බව සහතික කරමි.

II ශ්‍රේණියට සාමාන්‍ය ක්‍රමය / සුවිශේෂී ක්‍රමය යටතේ උසස් කිරීමට රියදුරු .......................................................... ගේ අයදුම්පත නිර්දේශ කරමි.

දිනය :- ..................................

..................................................
(ආයතන ප්‍රධානියාගේ අත්සන)

<u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දිනය :- ..................................

..................................................
(අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන)

28

ආකෘති (2)

## රියදුරු සේවයේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීමේ (සාමාන්‍ය ක්‍රමය / සුවිශේෂී ක්‍රමය) අයදුම්පත

(අදාළ නොවැකි වචන කපා හරින්න , 1 – 7 දක්වා ඡේද අයදුම්කරුද ඉතිරි 08 – 10 දක්වා ඡේද පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන ඒකක ප්‍රධානියා පිරවිය යුතුය)

01. සම්පූර්ණ නම :- ..............................................................................................

02. දැනට දරණ තනතුර /ශ්‍රේණිය :- ..........................................................................

03. සේවා ස්ථානය :- ..............................................................................................

04. මුල් පත්වීම් දිනය :- .........................................................................................

05. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ වර්ෂය හා දිනය :- ..............................
ලිපියේ අංකය :- ..............................

06. දෙවැනි භාෂා පරීක්ෂණය සමත් වූ වර්ෂය :- ..............................
ලිපියේ අංකය :- ..............................

07. I ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත් වූ වර්ෂය හා දිනය :- ..............................
ලිපියේ අංකය :- ..............................

රියදුරු සේවයේ II ශ්‍රේණියේ සාමාන්‍ය ක්‍රමය / සුවිශේෂී ක්‍රමය යටතේ උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබා ඇති බව සහතික වෙමි.

.................................. ..................................

(දිනය) (අයදුම්කරුගේ අත්සන)

08. උසස් වීමේ දිනය පූර්ව වසර 05 තුළ වැටුප් වර්ධක උපයාගෙන තිබේද ?

| වර්ෂය | ලබා ගත් වැටුප |
|---|---|
| .................................. | .................................. |
| .................................. | .................................. |
| .................................. | .................................. |
| .................................. | .................................. |
| .................................. | .................................. |

09. පූර්වාසන්න වසර 06 තුළ කාර්ය සාධන ඇගයීම් වාර්තාවේ සමස්ථ ඇගයීම් විස්තර

.................................... ....................................................
.................................... ....................................................
.................................... ....................................................
.................................... ....................................................
.................................... ....................................................

10. 1. සේවක මහතාට එරෙහිව විනය පරීක්ෂණ තිබේද ? ....................................................

එම විස්තර

2. සිදුවී ඇති වාහන අනතුරු තිබේද තිබේද ? ....................................................

එම විස්තර

**පෞද්ගලික ලිපි ගොනුව අනුව ඉහත අංක 1 - 10 කරුණු නිවැරදි බව සහතික කරමි.**

II ශ්‍රේණියට සාමාන්‍ය ක්‍රමය / සුවිශේෂී ක්‍රමය යටතේ උසස් කිරීමට රියදුරු ............................................................ ගේ අයදුම්පත නිර්දේශ කරමි.

දිනය :- ...................................

..............................................

(ආයතන ප්‍රධානියාගේ අත්සන)

<u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දිනය :- ...................................

..............................................

(අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන)

ආකෘති (3)

## රියදුරු සේවයේ I පන්තියේ සිට විශේෂ ශ්‍රේණියට (සාමාන්‍ය ක්‍රමය / සුවිශේෂී ක්‍රමය) උසස් කිරීමේ අයදුම්පත

(අදාළ නොමැති වචන කපා හරින්න , 1 -7 දක්වා ඡේද අයදුම්කරුද ඉතිරි 08 - 10 දක්වා ඡේද පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන ඒකක ප්‍රධානියා පිරවිය යුතුය)

01. සම්පූර්ණ නම :- ..................................................

02. දැනට දරණ තනතුර /ශ්‍රේණිය :- ..................................................

03. සේවා ස්ථානය :- ..................................................

04. මුල් පත්වීම් දිනය :- ..................................................

05. III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ වර්ෂය හා දිනය :- ..............................
ලිපියේ අංකය :- ..............................

06. දෙවැනි භාෂා පරීක්ෂණය සමත් වූ වර්ෂය :- ..............................
ලිපියේ අංකය :- ..............................

07. විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත් වූ වර්ෂය හා දිනය :- ..............................
ලිපියේ අංකය :- ..............................

රියදුරු සේවයේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබා ඇති බව සහතික වෙමි.

.............................. ..............................

(දිනය) (අයදුම්කරුගේ අත්සන)

08. උසස් වීමට පූර්ව වසර 05 තුළ වැටුප් වර්ධක උපයා ගෙන තිබේද ?

| වර්ෂය | ලබා ගත් වැටුප |
|---|---|
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |

09. පූර්වාසන්න වසර 05 තුළ කාර්ය සාධන ඇගයීම් වාර්තාවේ සමස්ථ ඇගයීම් විස්තර

................................ ................................................
................................ ................................................
................................ ................................................
................................ ................................................
................................ ................................................

10. 1. සේවක මහතාට එරෙහිව විනය පරීක්ෂණ තිබේද ? ..........................................................
එම විස්තර

2. සිදුවී ඇති වාහන අනතුරු තිබේද තිබේද ? ..........................................................
එම විස්තර

පෞද්ගලික ලිපි ගොනුව අනුව ඉහත අංක 1 - 10 කරුණු නිවැරදි බව සහතික කරමි.

විශේෂ ශ්‍රේණියට සාමාන්‍ය ක්‍රමය / සුවිශේෂී ක්‍රමය යටතේ උසස් කිරීමට රියදුරු ................................................ ගේ අයදුම්පත නිර්දේශ කරමි.

දිනය :- ................................

................................................
(ආයතන ප්‍රධානියාගේ අත්සන)

<u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දිනය :- ................................

................................................
(අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන)